# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2073/43 - 2018 ජුනි මස 01 වැනි සිකුරාදා - 2018.06.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (5) වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව, මා විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (1) වැනි ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යවරයාට විෂයයන් සහ කාර්යයන් පැවරීම වහාම ක්‍රියාත්මක වන පරිදි මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් පරිදි පවත්නා බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

නවින් දිසානායක,
වැවිලි කර්මාන්ත අමාත්‍ය.

2018 ජුනි මස 01 වැනි දින.

උපලේඛනය

ගරු ඒ. ඩී. චම්පික ප්‍රේමදාස, වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය

| I වැනි තීරුව<br>කාර්යයන් හා කර්තව්‍යයන් | II වැනි තීරුව<br>දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | III වැනි තීරුව<br>ක්‍රියාත්මක කළ යුතු නීති |
|---|---|---|
| 1. රබර් ක්ෂේත්‍ර විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ සංවර්ධන ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම. | 1. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව<br>2. තුරුසවිය අරමුදල<br>3. රබර් පර්යේෂණ ආයතනය<br>4. ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන සහ අපනයන සංස්ථාව | • 1953 අංක 36 දරන රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත<br>• 1930 අංක 10 දරන රබර් පර්යේෂණ ආඥා පනත<br>• 1956 අංක 11 දරන රබර් පාලන පනත<br>• 2000 අංක 23 දරන තුරුසවිය අරමුදල් පනත |
| 2. රබර් බෝගයේ ඵලදාව ඉහල නැංවීම සඳහා අවශ්‍ය සානුබල සහ අනෙකුත් පහසුකම් සැලසීම | | • I වැනි සහ II වැනි තීරුවල සඳහන් කර ඇති සහ වෙනත් කිසිදු අමාත්‍යවරයකුගේ විෂය පථයට නිශ්චිතව නොගැනෙන විෂයයන්ට අදාළ අනෙකුත් සියලුම අණ පනත් |
| 3. රබර් ක්ෂේත්‍රයේ ඵලදායීතාවය සඳහා අන්තර්ජාතික තරඟකාරීත්වය ඉහල නැංවීම | | |


1A - PG 4056 — 507 (2018/05)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උපලේඛනය (සම්බන්ධිතයි)*

| I වැනි තීරුව<br>කාර්යයන් හා කර්තව්‍යයන් | II වැනි තීරුව<br>දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | III වැනි තීරුව<br>ක්‍රියාත්මක කළ යුතු නීති |
|---|---|---|
| 4. රබර් බෝගය මත පදනම් වූ එකතු කළ වටිනාකම වැඩිකිරීම සම්බන්ධ කර්මාන්ත නගා සිටුවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම | | |
| 5. රබර් සම්බන්ධ බලපත්‍ර නිකුත් කිරීම | | |
| 6. බහු බෝග වගාවන් සහ සංගත ගොවිපල ක්‍රම තුළින් රබර් වගා ඉඩම් ප්‍රශස්ථ මට්ටමින් ප්‍රයෝජනයට ගැනීම සහ එමගින් නිෂ්පාදනය හා සේවා නියුක්තිය වැඩිකරලීම | | |
| 7. II තීරුවෙහි දක්වා ඇති ව්‍යවසායන් සඳහා සංවර්ධන කටයුතු හඳුන්වා දීම | | |
| 8. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති සියලුම සංවර්ධන විෂයයන්ට අදාළ කටයුතු | | |
| 9. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | | |
| 10. රබර් ලේකම් කාර්යාලයට අදාළ සංවර්ධන කටයුතු පසුවිපරම් කිරීම හා ඇගයීම | | |

06 - 598

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.